**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.**
**ගාල්ල දිස්ත්‍රික්කය**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 11 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.3,126,348 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදනයන් ඇතිකළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි උපකරණ තොගයේ ඇතුලත් වූ අයිතම් 10 ක වටිනාකම් ගිණුම් ගතකර නොතිබුණි. | විදුලි උපකරණ තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කලින් ලද වරිපනම් රු.106,676 ක් හා කඩකුලී රු.650 ක් සම්බන්ධයෙන් ගිණුම් ගැලපීම් සිදුකර නොතිබුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.7,153,999 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.79,058 ක වෙනසක් පැවතුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට පැවත එන රු.761,993 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

| | | | |
|---|---|---|---|
| (අ) | වර්ෂ 07 සිට වර්ෂ 11 දක්වා වූ කාල පරාසයක් තුළ අය නොවී පවතින රු.3,541,440 ක් වූ ගිණුම් ශේෂ 05 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | මහ හපුගල සහ වැලිපිටිමෝදර එළ හරක් මස් කඩ වලින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තුව රු.1,031,303 ක් විය. | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** අනුකූල නොවීම්

----------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) පාර්ලිමේන්තු පනත්** | | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී රු.858,816 ක් වූ ලැබිය යුතු වීපී පහන් ආධාර ශේෂය කපාහැර තිබුණි. | අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගිණුම් වල ගැලපීම් කල යුතුවේ. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) රීති 33 | වරිපනම් බදු පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ii) රීති 59 | සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (iii) රීති 69 | ඉඩම් විකිණීම මත වන බදු පිළිබඳ ලේඛනයක් පී.එස්.26 ඕ ආකෘති පත්‍රය ප්‍රකාර පවත්වාගෙන ගොස් නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (iv) රීති 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො/ 2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 05 ඡේදය | ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 06 ක ගිවිසුම් 2013 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය
-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.40,239,972 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,291,212 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
--------------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
----------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 17,527,00 | 17,885,826 | 10,938,119 | 48,922,922 | 13,969,000 | 13,678,198 | 10,659,166 | 41,858,398 |
| කුලී | 4,364,000 | 5,101,470 | 4,601,170 | 3, 386,564 | 4,987,000 | 5,099,370 | 4,936,452 | 2,890,264 |
| බලපත්‍ර ගාස්තු | 511,650 | 1,235,323 | 920,363 | 339,185 | 335,100 | 537,888 | 519,950 | 24,225 |
| වෙනත් ආදායම් (ගාස්තු) | 7,767,000 | 8,654,861 | 8,636,601 | 75,905 | 7,282,000 | 6,838,194 | 6,821,475 | 63,305 |
| | 30,169,650 | 32,877,480 | 25,096,253 | 52,724,576 | 26,573,100 | 26,153,650 | 22,937,043 | 44,836,192 |

**2.2.2 වරිපනම් හා බදු**

---------------------

**වරිපනම්**

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.10,000 ට වඩා වැඩි හිඟ ශේෂයන් පවතින වරිපනම් ඒකක 395 ක් පැවති අතර, අයවිය යුතු වරිපනම් බදු මුදල රු.7,898,707 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,340,543 ක් හා මුද්දර ගාස්තු රු.219,935,594 ක් විය. | අදාල නිලධාරීන්ගෙන් ලැබිය යුතු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------------

### 3.1 කාර්යසාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සභාව විසින් පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජනාධිපතිතුමාගේ 2017 අප්‍රේල් 20 දින අංක 2015/53 දරන ගැසට් නිවේදනය මඟින් ඉදිරිපත් කළ මාර්ගෝපදේශය පරිදි කසළ එකතු කිරීම සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සභාව සතුව නොතිබුණි. | කසළ කළමනාකරණය විධිමත්ව සිදුකල යුතුවේ. | කසළ කළමනාකරණ විධිමත්ව සිදුකරන බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට කටයුතු කළ යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| ද්විතීයික මට්ටමට අදාළ සේවකයන් 06 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත සේවකයන් 14 දෙනාගේ තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) සේවක ණය** | | |
| විශ්‍රාම ගිය හා සේවා ස්ථානය හඳුනාගත නොහැකි වීම හේතුවෙන් සේවකයින් 30 දෙනෙකුගෙන් වර්ෂ 10 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.445,392 ක් වූ ණය ශේෂය හා 2017 වර්ෂයේ වැඩ තහනමට ලක් වූ විදුලි කාර්මික සේවකයෙකුගෙන් අයවිය යුතු රු.100,122 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජූලි මාසයේ දී ධාවනයෙන් ඉවත් කර තිබූ රු.240,000 ක වටිනාකමින් යුත් ට්‍රැක්ටරය අළුත්වැඩියා කර ධාවනයේ යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදුකළ යුතුවේ. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරමි. |

**3.3.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී ඇති ජල බවුසරයෙහි අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අයිතිය සභාව වෙත පවරා ගත යුතුවේ. | ඉදිරියේ දී පවරා ගැනීමේ කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර එම වාර්තා වල පිටපත් විගණන අංශයට ලබා දී නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |